# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2312/72 - 2022 දෙසැම්බර් මස 31 වැනි සෙනසුරාදා - 2022.12.31

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන නිවේදන

### කොළඹ මහා නගර සභාව

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2017.07.26 දිනැති අංක 2029/29 දරන *අතිවිශෙෂ ගැසට්* නිවේදනය මගින් ප්‍රකාශයට පත්කරන ලද වාහන නැවැත්වීම සම්බන්ධ අතුරු ව්‍යවස්ථාවේ 11 (1) වගන්තිය හා 21 වගන්තිය යටතේ කොළඹ නගරය තුළ නවත්වා ඇති වාහනවලින් කොළඹ මහා නගර සභාව විසින් අය කළ යුතු වාහන නැවැත්වීමේ ගාස්තු සංශෝධනය කිරීම.

අංක 2960 දරන 2022 අප්‍රේල් 29 දිනැති සභා තීරණයට අනුව, කොළඹ නගරයේ වීදිවල හෝ වීදියක කොටසක නවතා ඇති වාහන සඳහා වාහන නැවතීමේ ගාස්තු පහත දැක්වෙන ආකාරයට උපලේඛනය I හි සඳහන් පරිදි හා වාහන නැවැත්වීමේ ගාස්තු ගෙවීමට අපොහොසත් වූවන්ගෙන් අය කළ යුතු ප්‍රමාද ගාස්තු උපලේඛනය II හි සඳහන් පරිදි කොළඹ මහා නගර සභාව විසින් සංශෝධනය කර ඇති බව සියලු දෙනාගේ දැනගැනීම පිණිස දන්වා සිටියි.

සංශෝධිත නව ගාස්තු *ගැසට්* නිවේදනය නිකුත් කළ දිනයේ සිට ක්‍රියාත්මක කෙරේ.

**ජේ. එම්. හද්‍රානි ජයවර්ධන,**
නාගරික කොමසාරිස්,
කොළඹ මහා නගර සභාව.

1A - PG 6139— 106 (2022/12)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## උපලේඛනය I

| | | පැයකට හෝ එහි කොටසක් සඳහා වාහන නැවැත්වීමේ ගාස්තුව (රුපියල්) | මසකට හෝ එහි කොටසක් සඳහා වාහන නැවැත්වීමේ ගාස්තුව (රුපියල්) |
|---|---|---|---|
| i. | යතුරු පැදියක් සඳහා | 20 | |
| ii. | මෝටර් ට්‍රයිසිකලයක් සඳහා | 40 | |
| iii. | මෝටර් රථයක් හෝ ද්විත්ව කාර්යය වාහනයක් සඳහා | 70 | |
| iv. | බස් රථයක්, මෝටර් කෝච්, මෝටර් ලොරියක්, සැහැල්ලු මෝටර් ලොරියක්, බර මෝටර් ලොරියක් සඳහා | 100 | |
| v. | පාසල් වෑන් රථයක් සඳහා | | 600 |
| vi. | පාසල් බස් රථයක් සඳහා | | 1,000 |
| vii. | කාර්යය මණ්ඩල සේවා වෑන් රථයක් සඳහා | | 1,200 |
| viii. | කාර්යය මණ්ඩල සේවා බස් රථයක් සඳහා | | 2,000 |

*සටහන :*

1. රජයේ නිවාඩු දින හැර මාසයක සෑම දිනකටම වාහන නැවැත්වීමේ ගාස්තුව අදාළ වේ.
2. ඉහත වාහන නැවැත්වීමේ ගාස්තුව පෙරවරු 6.00 සිට මධ්‍යම රාත්‍රී 12.00 දක්වා අදාළ වේ. කෙසේවෙතත් රෝහල් අසළ වාහන නැවැත්වීමේ ගාස්තුව පෙරවරු 6.00 සිට පස්වරු 6.00 දක්වා අදාළ වේ. එසේම පාසල් අසළ පෙරවරු 6.45 සිට පෙරවරු 7.45 දක්වා සහ දහවල් 12.00 සිට පස්වරු 1.30 දක්වා වාහන නැවැත්වීමේ ගාස්තු අදාළ නොවේ.

## උපලේඛනය II

නීත්‍යානුකූල නොවන ආකාරයට නවතා තැබූ වාහන සඳහා ප්‍රමාද ගාස්තු (රුපියල්)

| | | ප්‍රමාද ගාස්තු දැන්වීමක් නිකුත් කළ මොහොතේ සිට පැය 24ක් ඇතුළත ප්‍රමාද ගාස්තු ගෙවීම් සිදුකරන්නේ නම් පැයකට ප්‍රමාද ගාස්තු (රුපියල්) | ප්‍රමාද ගාස්තු දැන්වීමක් නිකුත් කළ මොහොතේ සිට පැය 24ක් ඇතුළත ප්‍රමාද ගාස්තු ගෙවීම් සිදුනොකරන්නේ නම් ප්‍රමාද ගාස්තු (රුපියල්) |
|---|---|---|---|
| i. | යතුරු පැදියක් සඳහා | 40 | 1,000 |
| ii. | මෝටර් ට්‍රයිසිකලයක් සඳහා | 60 | 1,500 |
| iii. | මෝටර් රථයක් හෝ ද්විත්ව කාර්යය වාහනයක් සඳහා | 100 | 2,500 |
| iv. | බස් රථයක්, මෝටර් කෝච්, මෝටර් ලොරියක්, සැහැල්ලු මෝටර් ලොරියක්, බර මෝටර් ලොරියක් සඳහා | 150 | 3,600 |
| v. | පාසල් ප්‍රවාහන හෝ කාර්යය මණ්ඩල ප්‍රවාහන වෑන් රථ රථයක් සඳහා | 100 | 2,500 |
| vi. | පාසල් ප්‍රවාහන හෝ කාර්යය මණ්ඩල ප්‍රවාහන බස් රථයක් සඳහා | 150 | 3,600 |

EOG 12 - 0409

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.